(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **56**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ජනවාරි 18 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ම'විසින් 2023 ජනවාරි 17 දින 'බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

2. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය වෙත ලැබී ඇති පළාත් සභා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 05 කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2023 ජනවාරි 17 දිනැති අංක 2315/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්—

(i) 2019 සහ 2020 වර්ෂ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2020 වර්ෂය සඳහා තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව, ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2017/2018 සහ 2018/2019 වර්ෂ සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කම්කරු සහ විදේශ රැකියා කටයුතු

පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පත;

(ii) මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත;

(iii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2021 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

බෙලිහුල් ඔය, පඹහින්න, සමනල පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩී.එල්. දේවප්‍රිය මහතාගෙන් ලැබුණු 2022.09.21 දිනැති පෙත්සම ගරු වජිර අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවේ (ඉ)(iii) ඡේදය සහ (4) සහ (5) අනු ව්‍යවස්ථා යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අග්‍රාමාත්‍යතුමා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේම නාම යෝජනා කිරීම මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නාවූ පහත සඳහන් තැනැත්තන් නම් කරනු ලැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාවේ (5) අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. ආචාර්ය ප්‍රතාප් රාමානුජම් මහතා

2. වෛද්‍ය දිල්කුෂි අනුලා විජේසුන්දර මහත්මිය

3. ආචාර්ය වැලිගම විදාන ආරච්චිගේ දිනේෂා සමරරත්න මහත්මිය

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පත :** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

(පූ.භා. 11.50 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 1.32 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 2.53 ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

(අ.භා. 4.04 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 23 ; විරුද්ධව 06; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසි අටදෙනෙකු (28) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Douglas Devananda | Yes |
| G 002. Nimal Siripala De Silva | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Bandula Gunawardana | Yes |
| G 010. Keheliya Rambukwella | Yes |
| G 014. Ramesh Pathirana | Yes |
| G 015. M.U.M. Ali Sabry | Yes |
| G 016. Vidura Wickramanayaka | Yes |
| G 017. Kanchana Wijesekera | Yes |

| | |
|---|---|
| G 018. Naseer Ahamed | Yes |
| G 019. Manusha Nanayakkara | Yes |
| G 020. Tiran Alles | Yes |
| G 022. Nalin Fernando | Yes |
| G 023. Roshan Ranasinghe | Yes |
| G 024. Jagath Pushpakumara | Yes |
| G 026. Dilum Amunugama | Yes |
| G 027. Mohan Priyadarshana De Silva | Yes |
| G 028. Janaka Wakkumbura | Yes |
| G 030. Kanaka Herath | Yes |
| G 031. Thenuka Vidanagamage | Yes |
| G 036. Arundika Fernando | Yes |
| G 037. Vijitha Berugoda | Yes |
| G 038. Lohan Ratwaththe | Yes |
| G 039. Sanath Nishantha | Yes |
| G 040. Tharaka Balasuriya | Yes |
| G 041. Indika Anuruddha Herath | Yes |
| G 045. D. V. Chanaka | Yes |
| G 046. Sisira Jayakody | Yes |
| G 047. Piyal Nishantha De Silva | Yes |
| G 048. Prasanna Ranaweera | Yes |
| G 049. D. B. Herath | Yes |
| G 050. Shasheendra Rajapaksa | Yes |
| G 052. Shantha Bandara | Yes |
| G 053. K. Kader Masthan | Yes |
| G 054. Ashoka Priyantha | Yes |
| G 055. A. Aravindh Kumar | Yes |
| G 056. Geetha Samanmale Kumarasinghe | Yes |
| G 057. Suren Raghavan | Yes |
| G 059. Sivanesathurai Santhirakanthan | Yes |
| G 060. Chamara Sampath Dasanayake | Yes |
| G 061. Anupa Pasqual | Yes |
| G 062. Johnston Fernando | Yes |
| G 065. Gamini Lokuge | Yes |
| G 068.C. B. Rathnayake | Yes |

| | |
|---|---|
| G 069. S. M. Chandrasena | Not Voted |
| G 070. Mahindananda Aluthgamage | Yes |
| G 072. Namal Rajapaksa | Yes |
| G 073. Sarath Weerasekera | Yes |
| G 079. Jayantha Ketagoda | Yes |
| G 082. U. K. Sumith Udukumbura | Yes |
| G 084. Sanjeeva Edirimanna | Yes |
| G 085. Akila Ellawala | Yes |
| G 088. Nalaka Bandara Kottegoda | Yes |
| G 090. Kokila Gunawardene | Yes |
| G 091. Milan Jayathilake | Yes |
| G 092. Kulasingam Dhileeban | Yes |
| G 093. Sudarshana Denipitiya | Yes |
| G 094. Isuru Dodangoda | Yes |
| G 099. Mayadunna Chinthaka Amal | Yes |
| G 102. Gunathilaka Rajapaksha | Yes |
| G 103. Upul Mahendra Rajapaksha | Yes |
| G 104. Rajika Wickramasinghe | Yes |
| G 106. Madhura Withanage | Yes |
| G 107. D. Weerasingha | Yes |
| G 108. Samanpriya Herath | Yes |
| G 109. Sagara Kariyawasam | Yes |
| G 110. Yadamini Gunawardena | Yes |
| G 111. Manjula Dissanayake | Yes |
| G 113. Jayantha Weerasinghe | Yes |
| G 114. Marjan Faleel | Yes |
| G 115. Lalith Varna Kumara | Yes |
| G 116. S. Jagath Samarawickrama | Yes |
| O 007. Lakshman Kiriella | No |
| O 016. Anura Dissanayaka | No |
| O 025. Harsha De Silva | No |
| O 028. R. M. Ranjith Madduma Bandara | No |
| O 037. Vijitha Herath | No |
| O 043. Ashok Abeysinghe | No |
| O 049. Hector Appuhamy | No |

O 055. Piyankara Jayaratne Yes

O 056. Vasudeva Nanayakkara No

O 057. Harini Amarasuriya No

O 064. Imran Maharoof No

O 069. Chaminda Wijesiri No

O 070. Waruna Liyanage No

O 072. Hesha Withanage No

O 075. Chandima Weerakkody No

O 081. W. H. M. Dharmasena No

O 089. Nimal Lanza Yes

O 090. Jayantha Samaraweera No

O 106. M. Rameshwaran Yes

O 108. Weerasumana Weerasinghe No

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව මහ ලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

Nazeer Ahamed Yes

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සහ 2 වැනි වගන්තිය සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කාර්යාංශයේ පරමාර්ථය

3. කාර්යාංශයේ පරමාර්ථය, සමාජ-ආර්ථික ප්‍රමිතීන් සකස් කිරීම මාර්ගයෙන්, සඵලදායී ප්‍රතිසංකලනය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් හෝ ප්‍රතිකාර සහ විවිධ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීම ඇතුළත් විය හැකි පුනරුත්ථාපනය අවශ්‍ය තැනැත්තකු ලෙස නීතියෙන් හඳුනාගනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු පුනරුත්ථාපනය කිරීම විය යුතු ය.''.

‘‘සංශෝධනය පිළිගත යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

‘‘වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 27 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

‘‘(අ) 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය) පිළිබඳ පනත ප්‍රකාරව, ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ඉල්ලා සිටින හෝ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබාදිය යුතු යැයි එම නීතියෙන් නියම කර ඇති ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ලබා දීම; .

(ආ) අදාළ නීතියක් ප්‍රකාරව පුනරුත්ථාපනය ඉල්ලා සිටින යම් තැනැත්තකු සඳහා හෝ පුනරුත්ථාපනය ලබා දිය යුතු යැයි එම නීතියෙන් නියම කර ඇති යම් තැනැත්තකු සඳහා පුනරුත්ථාපනය ලබා දීම;’’

‘‘සංශෝධනය පිළිගත යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 4 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

‘‘(ඉ) මානව හිමිකම් පිළිබඳ මූලික ධර්මතා සැලකිල්ලට ගනිමින් පුනරුත්ථාපනය, ප්‍රතිකාර සහ පසු සත්කාර සඳහා වන වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම;’’.

‘‘සංශෝධනය පිළිගත යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

‘‘වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය සභා සම්මත විය.

6 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 5 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

‘‘ (ආ) (මෙහි මින් මතු ‘‘පත්කළ සාමාජිකයන්’’ යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත්කරන ලද පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනාගෙන්:-

(i) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත පුනරුත්ථාපන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තන් දෙදෙනකු;

(ii) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත සමාජ සංකලනය ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තන් දෙදෙනකු; සහ

(iii) ශාස්ත්‍රීය සහ වෘත්තීය සුදුසුකම් සහිත නීතිය හා යථා පැවැත්ම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති තැනැත්තකු.’’.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තියේ සිට 10 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

11 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ගණපූරණය සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තියේ සිට 16 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

17 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 16 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 15 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තියේ සිට 22 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

23 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 8 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පුනරුත්ථාපන මධ්‍යස්ථාන

23. (1) මේ පනතේ කාර්යය සඳහා, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින්, අමාත්‍යවරයා විසින්, ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන්ට සහ නීතියෙන් හඳුනාගනු ලබන සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා නීතියෙන් විධිවිධාන සලසනු ලබන තැනැත්තන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය හැකි ය:''.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 18 වැනි පිටුවේ 19 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(2) යම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තන්, 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනතේ විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට ආරක්ෂිතව සිටින බවට සහතික කර ගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු පත් කර ඇත්තේ යම් අධිකරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් ද, එම අධිකරණ කොට්ඨාසය තුළ පිහිටා ඇති සෑම පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට ම යටත් පිරිසෙයින් සෑම මසකට එක් වරක්වත් පැමිණීම සෑම මහෙස්ත්‍රාත්වරයකුගේ ම කාර්යය විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත පැමිණෙන මහේස්ත්‍රාත්වරයා විසින්-

(අ) පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තා පුද්ගලිකව දැක බලාගෙන ඔහුගේ යහසාධනය, සුබසාධනය සහ එම තැනැත්තා එම මධ්‍යස්ථානයේ තබාගෙන සිටින්නේ කවර තත්ත්වයන් යටතේ ද යන්න පිළිබඳ සොයා බැලිය යුතු අතර මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන වාර්තා සහ ලොග් පොත් පරීක්ෂා කරනු ලැබිය හැකි ය; සහ

(ආ) ඔහුගේ නිරීක්ෂණ සහ පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් පැමිණිල්ලක් වාර්තා කරනු ලැබිය යුතු ය.

(4) පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තන් වධදීමට ලක්වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක දී, වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා වෙත ඉදිරිපත් කරන ලෙස ද, එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(5) පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තා වධදීමට ලක්වී ඇති බවට එම වෛද්‍ය නිලධරයාගේ වාර්තාව මගින් අනාවරණය වන අවස්ථාවක දී, එම තැනැත්තා ප්‍රතිකාර සඳහා වහාම ආණ්ඩුවේ රෝහලකට ඇතුළත් කරනු ලැබිය යුතු බව සහ එම මධ්‍යස්ථානය භාරව කටයුතු කරන නිලධරයා විසින්, එම තැනැත්තා පුනරුත්ථාපනය කිරීම සඳහා වන ආඥාව ඉදිරිපත් කරනු ලැබූ අධිකරණයට, ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයාගේ සොයාගැනීම් පිළිබඳ වහාම දැනුම්දිය යුතු බවට වන ආඥාවක් ඇතුළු උචිත ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

(6) වධදීම සිදු කර ඇතැයි චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා නීතිපතිවරයාට හැකි කරවනු පිණිස, කරන ලදැයි කියනු ලබන වධදීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය යුතු ය.

(7) පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනය වෙමින් සිටින තැනැත්තන්ගේ හිමිකම්, නීතියෙන් විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට ආරක්ෂා කරනු ලබන බවට සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, ස්වකීය කැමැත්ත මත හෝ ලද පැමිණිල්ලක් මත හෝ, සෑම මධ්‍යස්ථානයකට ම පැමිණිය හැකි අතර, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව උචිත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

24 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වර්තකයන් හෝ නියම කරනු ලැබිය හැකි යම් අනවසර භාණ්ඩයක් අධිකාරි බලයකින් තොරව".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

25 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"හෝ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හැර, හෙළිදරව් නොකරන බවට".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 19 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 9 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) පුනරුත්ථාපන මධ්‍යස්ථානයක භාරයේ සිටින තැනැත්තකුට අදාළ සියලු වාර්තා රහසිගත විය යුතු අතර, එම වාර්තා-

(අ) එම තැනැත්තා හෝ එම තැනැත්තාගේ ළඟම ඥාතියා හෝ එම තැනැත්තාව නියෝජනය කරන නීතිඥවරයකු විසින් හෝ කරනු ලබන ඉල්ලීමක් මත; හෝ

(ආ) අධිකරණ ආඥාවක් මත හෝ වරදක් සිදු කිරීමට අදාළව සිදු කරනු ලබන විමර්ශනයක් සම්බන්ධයෙන්,

හැර මුදාහරිනු නොලැබිය යුතු ය;

එසේ වුව ද, එම තැනැත්තාට හෝ එම තැනැත්තා විසින් තොරතුරු හුවමාරු නොකරන ලෙසට උපදෙස් දී ඇත්නම් මිස, එම තැනැත්තාගේ ළඟම ඥාතියාට හෝ එම තැනැත්තාව නියෝජනය කරන නීතිඥවරයකුට හෝ ඔහුට ප්‍රතිකාර කිරීමට හෝ ඔහු පුනරුත්ථාපනය කිරීමට අදාළ තොරතුරු ඇතුළු පුනරුත්ථාපන මධ්‍යස්ථානය භාරයේ සිටින තැනැත්තාට අදාළ තොරතුරු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ප්‍රතිකාර ලබමින් සිටින තැනැත්තන්ට පහරදීම ආදිය

26. පුනරුත්ථාපනය යටතේ සිටින යම් තැනැත්තකුට පහර දෙන, තුවාල සිදු කරන හෝ හිතාමතාම නොසලකා හරින පුනරුත්ථාපන".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 28 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සේවා නියුක්තයන්ට බාධා කිරීම වරදක් බව

27. මේ පනත යටතේ තම නීත්‍යානුකූල කාර්ය ඉටුකිරීමේ දී යම් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක සේවයේ නියුක්තව සිටින යම් තැනැත්තකුට නීති විරෝධී ලෙස බාධා කරන හෝ නීති විරෝධී ලෙස බාධා කිරීමට තැත්කරන යම් තැනැත්තකු විසින් මේ".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

28 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 20 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 6 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"යම් පොලිස් නිලධරයකු හෝ මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකු විසින් අල්ලා ගෙන නැවත පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත වහාම භාර දෙනු".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 13 වැනි සහ 14 වැනි පේළි ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අවශ්‍ය විය හැකි අවම බලය ඔහු විසින් තත් කාර්යය සඳහා භාවිත කිරීම නීත්‍යානුකූල විය යුතු ය.".

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 14 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''(3) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ වන යම් බලය ක්‍රියාත්මක කිරීමක් පිළිබඳ, එම පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටා තිබෙන අධිකරණ කොට්ඨාසය ඇතුළත සිටින මහෙස්ත්‍රාත්වරයාට වහාම දැනුම්දීම පුනරුත්ථාපන කොමසාරිස්-ජනරාල්වරයාගේ හෝ ඔහු විසින් නිසි පරිදි බලය ලබා දුන් තැනැත්තකුගේ කාර්යය විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 20 වැනි පිටුවේ 16 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

30 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 20 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පුනරුත්ථාපන සහාය පිළිබඳ විස්තර ද, යම් තැනැත්තකු විසින් පුනරුත්ථාපන ක්‍රියාවලියේ කොටසක් ලෙස ලබාගෙන ඇති පුනරුත්ථාපනයට අදාළ විස්තර ද නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණයක් ද ඇතුළත් විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

31 වැනි වගන්තියේ සිට 33 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

34 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ඇ) කාර්යාංශයේ කටයුතු හා සම්බන්ධ යම් කාරණයක්:

එසේ වුව ද, මේ පනත ප්‍රකාරව නියෝග සාදනු ලැබීමට නියම කරන ලද යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය සභාව සතු නොවන්නේ ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

35 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 22 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''නියෝග 35. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 9 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''බලතලවල ව්‍යාප්තයට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) පුනරුත්ථාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම;

(ආ) කාර්යාංශය විසින් පුනරුත්ථාපනය කරනු ලැබිය හැකි එක් එක් තැනැත්තන් වර්ග සම්බන්ධයෙන් පුනරුත්ථාපනය, ප්‍රතිකාර කිරීම, පසු සත්කාර සහ උපකාරක සේවා සඳහා වන වැඩසටහන්;

(ඇ) පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට ඇතුළත් කරනු ලැබූ තැනැත්තන් මුදා හැරීමට අදාළ නියම සහ කොන්දේසි;සහ

(ඈ) පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි දත්ත සමුදායක්, වාර්තා සහ ලොග් පොත් පවත්වාගෙන යාම:''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සම්බන්ධයෙන් වන යම් නියෝගයක් සෑදීමේ දී ලබා ගත යුතු ය:

එසේම තවදුරටත්, අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ නියෝග සෑදීමට පෙර මේ පනත යටතේ පත් කරනු ලැබූ සභාවෙහි එකඟත්වය ලබා ගත යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර අනුමතය සඳහා හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එම

නියෝග, පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසු හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක දී බලාත්මකභාවයට පත්විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

36 වැනි වගන්තිය සභා සම්මත විය.

37 වැනි වගන්තිය

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 25 වැනි පිටුවේ 16 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පුනරුත්ථාපනය කිරීම යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු පුනරුත්ථාපනය, ප්‍රතිකාර කිරීම, පසු සත්කාර සහ උපකාරක සේවා සඳහා වන කාර්ය පටිපාටීන් සහ වැඩසහටන් අදහස් වේ.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

38 වැනි වගන්තිය සභා සම්මත විය.

පූර්විකාව

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''**පූර්විකාව**

ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් බවට පත්ව ඇති පුද්ගලයන් සහ වෙනත් යම් නීතියක් ප්‍රකාරව හඳුනාගනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම විධිමත් කිරීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම සැලකිල්ලට ගැනීමේ දී එය බරපතළ ගැටළුවක් සහ ජාතික ප්‍රශ්නයක් බවට පත්ව ඇති හෙයින් ද:

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ සහ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ විධිවිධාන යටතේ දැනටමත් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් ධුරය පිහිටුවා ඇති හෙයින් ද:''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"පූර්විකාව සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**8. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව (2019):** කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 22 වගන්තිය යටතේ 2021.12.04 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**9. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2018):** කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2022.04.07 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**10. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2019):** කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2022.11.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**11. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018):**සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2021.12.10 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**12. හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව (2017):** සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 15,16 සහ 17 වගන්තිය යටතේ 2022.07.27 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෝමියෝපති වෛද්‍ය සභාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**13. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2019):** සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍ය වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2022.08.09 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**14. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018):** සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2022.09.20 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**15. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020):** සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2022.09.20 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**16. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2016):** සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 23(1), (2) වගන්ති යටතේ 2022.11.08 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**17. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020):** කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය යටතේ 2022.09.20 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**18. රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019):** කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ 2021.12.10 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය දැව සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**19. රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020):** කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ 2022.11.09 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය දැව සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**20. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2014):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2017.02.21 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**21. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2016):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2020.01.07 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**22. උද්භිද උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික වාර්තාව (2017):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනතේ 2 වගන්තිය යටතේ 2019.11.07 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2017 වර්ෂයේ ජාතික උද්භිද උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**23. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව (2017):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2020.02.18 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**24. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2022.04.06 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**25. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2019):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2022.04.06 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**26. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2019):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2022.04.06 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**27. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2020):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ

යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2022.04.06 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**28. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020):** සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 23(5) වගන්තිය යටතේ 2020.09.23 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**29. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව (2020):** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ 10 වගන්තිය යටතේ 2022.11.09 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**30. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.08 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් 2023 ජනවාරි 19 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.